**ත්‍රිකුණාමලය නගර සභාව - 2023**
**------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ත්‍රිකුණාමලය නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරිය)181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ත්‍රිකුණාමලය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මිල දී ගන්නා ලද, පරිත්‍යාග ලෙස ලැබුණු පොත් වල එකතු වටිනාකම රු. 467,579 ලෙස පැවති නමුත් මූල්‍ය ප්‍රකාශනවල රු. 384,162 ක් ලෙස අඩුවෙන් දක්වා තිබුණි. | ප්‍රවර්ථන වර්ෂයේ අවසන් ගිණුමේ පරිත්‍යාග ලෙස ලැබුණු පොත්වල වටිනාකම නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | පරිත්‍යාග ලෙස ලැබූ වත්කම් ගිණුමට ඇතුළත් කිරීමට පියවර ගත යුතුයි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ලිංගනගර හාල් පිටි අසුරුම් කිරීමේ කර්මාන්ත ශාලාව වෙත ප්‍රාදේශීය සභායක ව්‍යාපෘතිය මගින් මිලදී ගන්නා ලද එකතු වටිනාකම රු. 2,600,000 ක් වූ යන්ත්‍ර උපකරණ, සවිකිරිම් 14 ක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | LDSP ව්‍යාපෘතිය මගින් ලිංගනගර හාල් පිටි ඇඹරුම් කිරීමේ කර්මාන්ත ශාලාව සඳහා මිලදී ගන්නා ලද රු. 2,600,000 ක් වටිනා යන්ත්‍ර උපකරණවල වටිනාකම අදාළ මූල්‍ය වර්ෂයේ අවසන් ගිණුමට ඇතුළත් කර ඇත. | යන්ත්‍ර උපකරණ, සවිකිරිම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | වසර 14 කට වැඩි කාලයක් මූල්‍ය ප්‍රකාශනවල විදුලි බල මණ්ඩල භාරදීම ලෙස දක්වා ඇති රු. 5,010,261 සම්බන්ධයෙන් නිසි ලියවිලි හා සනාථ කළ හැකි සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | එම කරුණු සම්බන්ධ පැහැදිලි කිරීම් විදුලි බල මණ්ඩල වෙතින් ලද පසුව නිසි කටයුතු කරනු ලැබේ. | නිසි ලියවිලි ලබා ගැනීමට පියවර ගත යුතුයි. |
| (ආ) | 2008 වර්ෂයට පෙර කාලය තුළ ලබා දෙන ලද විශේෂ අත්තිකාරම් හිඟය රු.1,041,246 සම්බන්ධයෙන් නිසි ලියවිලි හා සනාථ කළ හැකි සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | විස්තර ලද පසුව එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | වසර 15 කට වැඩි කාලයක් මූල්‍ය ප්‍රකාශනවල වත්කම් යටතේ දක්වා ඇති අයනොවන උපයෝගිතා සේවා රු. 110,137 සම්බන්ධයෙන් නිසි ලියවිලි, ලේඛන, සනාථ කළ හැකි සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අයනොවූ උපයෝගිතා සේවා සඳහා වන ලියවිලි කිසිවක් දැනට හඳුනා ගත හැකි තත්ත්වයේ නොමැත. එබැවින් මෙම ලියවිලි ලද පසුව ඔබ වෙත ඉදිරිපත් කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල දක්වන සෑම විෂයන්ටම සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි, කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 571 (1), (2), (3) | කොන්ත්‍රාත්කරුවන්ට ආපසු ලබා දීමට තිබූ රැඳවුම් මුදල් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | රැඳවුම් මුදල් නිසි පරිදි සලකා බලා කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ආ) | **වෙනත් චක්‍රලේඛ** | | | |
| | 2018 ජනවරි 24 දිනැති අංක 05/2018 පළාත් පාලන - 01 දරණ පළාත් පාලන ආයන සඳහා වන චක්‍රලේඛය | ආයතන කාර්ය මණ්ඩලය ලබාගත යුතු හැකියා පරතර හඳුනා ගෙන ආයතන සඳහා වන විශේෂ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සහ වාර්ෂික කාර්යසාධන ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික කාර්යසාධන ගිවිසුම අත්සන් කරීම සඳහා කළමනාකරණයේ අවධානය යොමු කරනු ලැබේ. | චක්‍රලේඛයට ප්‍රකාරව අදාළ කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු. 59,152,235 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම් ඉක්මවූ ආදායම රු. 96,899,734 ක් විය. ඉකුත් වර්ෂයට වඩා සමානලොචිත වර්ෂයේ ආදායම් රු. 37,747,499 කින් අඩුවී ඇත.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 39,105,000 | 143,594,750 | 45,418,121 | 98,176,629 | 42,355,000 | 40,376,000 | 41,992,000 | 100,061,000 |
| (ii) | කුලී | 32,320,000 | 83,764,504 | 29,818,993 | 53,945,511 | 36,570,000 | 28,925,000 | 20,727,000 | 45,623,000 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 18,783,460 | 23,504,203 | 22,736,968 | 767,235 | 12,668,000 | 19,124,000 | 19,124,000 | -- |
| (iv) | වෙනත් ආදායම් | 17,423,000 | 172,415,963 | 92,113,921 | 80,302,042 | 14,330,000 | 11,038,000 | 6,038,000 | 33,212,000 |
| (v) | එකතුව | 107,631,460 | 423,279,420 | 190,088,003 | 233,191,417 | 105,923,000 | 99,463,000 | 87,881,000 | 178,896,000 |

- ප්‍රාග්ධන වියදම් සඳහා ලබා දෙන ලද ප්‍රාග්ධන ආදායම් වන රු. 29,445,657 මුදල ආදායම් වියදම් ගිණුමේ ආදායම් ලෙස පෙන්නුම් කර ඇති බැවින් පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 29,445,654 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ සියලුම ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු**<br>සමාලෝචිත වර්ෂයේ පැවති එකතුව රු. 88,514,106 ක දේපළ බදු හිඟය අයකිරීමට සභාව විසින් නිසි කටයුතු කර නොතිබුණි. | හිඟය අයකිරීමට කටයුතු කරනු ලැබේ. | දේපළ බදු හිඟය අයකිරීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **කුලී** | | |
| (i) | කඩ 390 ක් සඳහා වන කුලි හිග එකතුව රු. 49,138,586 ක මුදල වසර 13 ක කාලයක සිට අයකිරීමට කටයුතු කර නොතිබුණි. | දිගු කාලීන හිඟ ඇති බදු කරුවන්ගෙන් හිඟ අයකරීමට විශේෂ අවධානය යොමු කරණු ලැබේ. | හිඟ අයකරීමට නිසි පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | නගර සභාවට සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය අතර ගිවිසුමට අනුව මාළු වෙළෙඳපොළ ගොඩනැගිලි සංකීර්ණයෙන් ලැබෙන ආදායමෙන් 30% ක් සභාව වෙත ගෙවිය යුතුය. නමුත් 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා හිඟ මුදල රු. 8,302,842 අයකර නොතිබුණි. | හිඟ මුදල සහ ඉදිරි කාලය සඳහා තක්සේරු දෙපාර්තමේන්තු විසින් තීරණය කරන මාසික කුලියද ලබා දීමට එකඟ වී ඇත. | හිඟ මුදල් අය කිරීමට නිසි කටයුතු කළ යුතුය. |

### 2.2.3 මුද්දර ගාස්තු

| | | |
|---|---|---|
| 2020 වර්ෂයේ සිට 2022 දක්වා කාල සීමාවතුල සභා බල ප්‍රදේශය තුල සංචන නොවෙන දේපළ හුවමාරුවේදි අයකරන ලද රු. 43,836,720 ක මුද්දර ගාස්තුව නැගෙනහිර පළාත් භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර ලබා ගැනීමට සභාවට නොහැකිවූ නිසා එම මුදල පළාත් අරමුදලේ ආදායම් ලෙස දක්වා තිබුණි. | හිඟ මුද්දර ගාස්තුව ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | මුද්දර ගාස්තුව ලබා ගැනීමට කටයුතු කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

මහ නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | නගර සභා සතු රක්ෂණය නොකරන ලද වාහනයක් 2023 වර්ෂයේ අනතුරට ලක් වී ඇති නමුත් අදාළ අනතුර සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා සහ අවසන් වාර්තා සකස් කර නොතිබුණු අතර විගණකාධිපති වෙතද දන්වා නොතිබුණි. | වාහන අළුත්වැඩියා සම්බන්ධ අනිකුත් කටයුතු සිදුවෙමින් පවති. | අදාළ කටයුතු සිදු කල යුතුය. |
| (ආ) | නගර සභා පාලනයට අයත් හින්දු සුසාන භූමියේ ආදාහන කටයුතු සඳහා භාවිතා කරන මේ දක්වා වටිනාකම හඳුනා නොගත් 06 ජීව වායු (Gas slinder) සහ වාහන යන්ත්‍ර වැනි වත්කම් සමාලෝචිත කාලයතුල සොරකම් කර තිබූ නමුත් අදාළ කරුණු සම්බන්ධයෙන් මුල්‍ය ප්‍රකාශනයේ හෙලිදරව් කර නොතිබුණු අතර හානි සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා සහ අවසන් වාර්තා සකස් කර නොතිබුණි. | ප්‍රාරම්භක වාර්තා ලැබී අතිරේක කටයුතු සඳහා ප්‍රධාන අමාත්‍යාංශය වෙත යවා ඇත. | එම |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| **(අ)** | **රජයේ නිලධාරින්ගේ නිවාස** | | |
| (i) | නගර සභාව සතු නිවාස 69 සඳහා වත්කම් ලේඛන පවත්වා නොතිබුණි. තවදුරටත් කුලි අයකිරීම සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදුකර නොතිබුණි. | මෙම නිවාසවලින් භාවිතයට නුසුදුසු නිවාස ඉවත් කිරීමට කටයුතු කර ඇත. | වත්කම් ලේඛන පවත්වා යාවත්කාලීන කිරීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ii) | ශාන්ත අන්තෝනි පාරේ පිහිටි නිලධාරීන්ගේ අංක 19 නිවස 2005 වසරේ සිට මේ දක්වා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාට ලබා දී ඇතත් ඔහු සමඟ කිසිදු ගිවිසුමකට එළඹී නොමැති බැවින් රු. 1,699,772 ක කුලි අහිමි වී තිබුණි. | නිවාස සම්බන්ධයෙන් ප්‍රධාන අමාත්‍යවරයා සහ අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වී ගිවිසුම සහ කුලී මුදල් සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. | කුලිය අයකිරීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | වසර 05 සිට වසර 20කට වැඩි මුල්‍ය ප්‍රකාශනවල නැවත ගෙවිය යුතු තැන්පතු වල ඇතුලත් එකතුව රු. 72,798,344 ක තැන්පතු සම්බන්ධයෙන් අදාළ පුද්ගලයන්ට ගෙවීමට හෝ රාජ්‍ය ආදායමට ගැනීමට හෝ සභාව විසින් කටයුතු කර නොතිබුණි. | තැන්පතු මුදල් ප්‍රවර්ථන වර්ෂයේ ආදායම් ගිණුමට මාරු කිරීමට අදාල කටයුතු සිදු කරමින් පවති. | සුදුසු කටයුතු කළ යුතුයි |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | නගර සභාව සතු කඩ කාමර 126 ක් 2019 වසරේ සිට කුලියට ලබාදී නොතිබුණි. මේ නිසා සභාවට එකතුව රු.22,793,053 ක ආදායමක් අහිමි වී තිබුණි. | එම කඩවල් වෙනස් කරීම සඳහා කටයුතු ඉදිරි කාලයේ දී ගෙන කුලියට ලබා දෙනු ලැබේ. | කඩවල් බදු දීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | ප්‍රත්‍යාගණනය නොකර 2009 වර්ෂයේ දි සිදුකල දේපල ප්‍රත්‍යාගණනය මත කුලි අයකරන බැවින්, සභාවට විශාල ආදායමක් අහිමිවී ඇත. | ප්‍රත්‍යාගණනයන් ලැබුණු විගස නව දේපළ බදු අයකිරීම් සිදුකරනු ලැබේ. | දේපළ ප්‍රත්‍යාගණනය කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ නගර සභාව සතු කඩවල් බදු දී ඇතත්, සියලුම බදුකරුවන් සමඟ බදු ගිවිසුම් ඇති කරගෙන නොතිබුණි. | බදු කරුවන් සමඟ ප්‍රවර්ථන වර්ෂයේ අදාල කරුණු පිළිබඳ ගිවිසුම්වලට එළඹීමට පියවර ගනු ලැබේ. | ගිවිසුම්වලට එළඹීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සංචාරක පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා 2023 වර්ෂයේ අගෝස්තු මාසයේදී රු. මිලියන 10 ක් වටිනා ද්‍රව්‍ය ලැබුණු නමුත් මේ දක්වා භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. | සංචාරක පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු අවසන් වූ පසු ද්‍රව්‍ය අදාළ අරමුණු සඳහා යොදා ගනු ලැබේ. | අදාළ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුයි |

**3.4 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| **3.4.1** | **නිෂ්කායර් / ඌන උපයෝජිත වත්කම්** | | |
| **(අ)** | රෝහල් අපද්‍රව්‍ය පිළිස්සීම සඳහා සවිකරණ ලද රු. 5,695,830ක් වටිනා යන්ත්‍රය 2018 වර්ෂයේ මේ දක්වා සිට භාවිත නොකර පැවතුණි. | අදාළ යන්ත්‍රය ආර්ථික වශයෙන් අලුත්වැඩියා කිරීම සහ ක්‍රියාත්මක කිරීම අකාර්යක්ෂම බව | අදාළ අරමුණ ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුයි |
| **(ආ)** | මධ්‍යම වෙළෙඳපොළ ගොඩනැඟිලි කඩකාමර සංකීර්ණයේ ඇති කඩකාමර 48ක් 2009 වසරේ සිට නිෂ්කාර්යව පැවතුණි. | ඉදිරි කාලයේ දී බදු දීමට පියවර ගනු ලැබේ. | ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුයි |
| **3.4.2** | **විනාශ නොකළ/ වෙන්දේසි නොකළ වත්කම්** | | |
| | නගර සභාවට අයත් වාහන 40ක් දීර්ඝ කාලයක සිට භාවිතයට ගත නොහැකි තත්ත්වයක පවතින බව දක්නට තිබුණද ඒවා ඉවත් කිරීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි. | Valuation Report ලබී ඇති අතර මෙම වාහන විකිණීම සඳහා කටයුතු කරමින් පවතී. | නිසි ක්‍රියාමාර්ග ගත යුතුයි |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| **(අ)** | ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 74ක්, ද්විතීයික මට්ටමේ නිලධාරි පුරප්පාඩු 44ක් සහ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 02ක් ලෙස එකතුව පුරප්පාඩු 120ක් පිරවීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු අඛණ්ඩව සිදුකරමින් පවතී. | ඌනතාවය පිරවීමට අදාළ කටයුතු කළ යුතුය. |
| **(ආ)** | සභාවේ ලේකම් සහ ගණකාධිකාරී තනතුරු වසර 07කට වැඩි කාලයක සිට පුරප්පාඩුව පවතින නමුත් ඒ සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සහ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සිටින කෙනෙකු පත් කර නොතිබුණි. | එම | ඌනතාවය පිරවීමට අදාළ කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | කාර්ය මණ්ඩල සඳහා වු ණය ලේඛනයට අනුව, සමාලෝචිත වර්ෂයේ හිඟ ශේෂයේ හඳුනාගෙන නොමැති සේවකයින්ගේ හිඟ ණය රු. 500,752ක් පැවතුණි.මෙය අයකර ගැනීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි. | ප්‍රවර්ථන වර්ෂයේ ඉහත සඳහන් කළ මුදලට ගැලපීම් කිරීමට ආළ කටයුතු ගනිමින් සිටී. | හිඟ නිරවුල් කිරීමට අදාළ කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 තිරසර සංවධර්න ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත අනුව තිරසර සංවර්ධන අරමුණු ලෙස ඉලක්ක හතරක් හඳුනාගෙන ඇති අතර, සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිත කිරීමෙන් ළඟා කර ගත හැකි වෙනත් ඉලක්ක හඳුනාගෙන ඒවා භෞතිකව ළඟා කර ගත හැකි ලෙස සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2030 වන විට ළඟා කර යුතු තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයක් සකස් කර ඇත. | තිරසාර සංවර්ධනය පිළිබඳ න්‍යාය පත්‍රයක් සකස් කිරීමට පියවර ගත යුතුයි |